• සභාව කල්තබන අවස්ථාවේ අසන ලද ප්‍රශ්න.

6. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2018.08.07 වන දින සභාව කල්තබන අවස්ථාවේ දී අසන ලද ප්‍රශ්නය, (ප්‍ර/VI/(1)/18/ADG-03)

අ. පළාත් සභාවේ ආයුර්වේද රෝහල්වල කාර්යභාර වෛද්‍ය නිලධාරීන්, වෛද්‍ය අධිකාරීන් හා වෛද්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබේද?

ආ. එම තනතුරු සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබී ඇත්තේ, බස්නාහිර පළාත් ආයුර්වේද රෝහල්වල සේවය කරන වෛද්‍ය නිලධාරීන් සඳහා පමණක් බව පිළිගන්නේද?

ඇ. බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල සේවය කරන වෛද්‍ය නිලධාරීන්ට එකී තනතුරු සඳහා අයදුම් කළ නොහැකි වී ඇති බව පිළිගන්නේද?

ඈ. ඒ අනුව බස්නාහිර පළාතේ පළාත් පාලන ආයතනවල තනතුරුවල වෛද්‍ය නිලධාරීන්ට අසාධාරණයක් සිදු වන බව පිළිගන්නේද?

ඉ. මෙම තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන්නේද?

ඊ. නොඑසේ නම්, ඒ මන්ද?

7. ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට, (ප්‍ර/VI/(1)/18/44)

අ. වර්ෂ 2006 සිට වර්ෂ 2014 දක්වා බස්නාහිර පළාත් සභාවට අයත් පලාත් පාසල් කොපමණ සංඛ්‍යාවක් වැසී ගොස් තිබේද?

ආ. ඒවා දිස්ත්‍රික්කය හා කලාප වශයෙන් හඳුන්වන්නේද?

ඇ. එසේ නම් ඒ මොනවාද?

ඈ. වර්ෂ 2015 සිට මේ දක්වා (2018) මෙම පළාත් සභාවට අයත් පාසල් වැසී ගොස් තිබේද? එසේ නම් ඒවා මොනවාද?

ඉ. මෙම පාසල් වැසී යාමට සිදුවූ සුවිශේෂ හේතු පැහැදිලි කල හැකිද? එසේ නම් එය කුමන හේතුවක් නිසාද?

ඊ. ඉදිරියේදීත් මෙම පළාත තුල වැසී යාමේ තර්ජනයට ලක් වී ඇති පාසල් තිබේද? එසේ තිබේ නම් ඒ පිළිබඳ ගත හැකි ක්‍රියා මාර්ගය පැහැදිලි කල හැකිද? එය කුමක්ද?

**10.** ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂි කර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ <u>අමාත්‍යතුමාගෙන් ඇසීමට,</u> (පු/VI/(1)/18/47)

අ. I. කළුතර දිස්ත්‍රික්කයේ විසිතුරු මසුන් ඇති කරන්නන්ගේ සමිති කොපමණ තිබේද?

II. එම සමිති වල නම් කවරේද?

III. මෙම සමිති ධීවර අමාත්‍යාංශයේ ලියාපදිංචි වී තිබේද?

ආ. I. බස්නාහිර පළාත් ධීවර අමාත්‍යාංශය මඟින් 2017 වර්ෂයේ කළුතර දිස්ත්‍රික්කයේ විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය සඳහා ආධාර ලබා දී තිබේද?

II. එය කොපමණද?

III. මෙම ආධාර ලබා දීමේ දී අනුගමනය කළ නිර්ණායක කවරේද?

IV. මෙම ආධාර සමිති සඳහා ලබා දී තිබේද?

V. එසේ නම් මෙම සමිති වල නම් හා ආධාර ප්‍රමාණය කවරේද?

**11.** ගරු නන්දන පත්මකුමාර මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ <u>අමාත්‍යතුමාගෙන් ඇසීමට,</u> (පු/VI/(1)/18/48)

අ. I. කළුතර දිස්ත්‍රික්කයේ සිසුන් 100 ට අඩු පළාත් පාසල් තිබේද?

II. එම සංඛ්‍යාව කොපමණද?

ආ. I. එය අධ්‍යාපන කලාප මට්ටමින් කොපමණද?

II. මෙම පාසල් වල නම් හා දරුවන් සංඛ්‍යාව වෙන වෙනම ඉදිරිපත් කරන්නේද?

III. මෙම පාසල් වල දරුවන් අඩු වීම සම්බන්ධයෙන් ඔබ අමාත්‍යාංශය මඟින් සොයා බැලීමක් කර තිබේද?

IV. ඒ සම්බන්ධව ගෙන ඇති පියවර කවරේද?

VII. පෞද්ගලික ප්‍රකාශ

VIII. වරප්‍රසාද කඩවීම් පිළිබඳ ප්‍රකාශ

IX. අමාත්‍යාංශ නිවේදන / අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ / වරප්‍රසාද කඩවීම් පිළිබඳ පිළිතුරු

